# අඳුර සහ එළිය වැනි මුසාව හා සැබෑව

ලොවෙහි මෙන් මැ මුළු මහත් විශ්වය තුළැ ඇති මූලික වූ නැතහොත් කෘතිම නො වන කරුණු යුගලයන් දෙකක් ගැන මම සිතා බැලුවෙමි. ඒ අතරින් අඳුර සහ එළිය යනු පළමු යුගලය යි. විශ්වය තුළැ මුලින් මැ ඇති වී තිබෙන්නේ අඳුර යැයි මම සිතමි. අඳුරෙහි උපදින්නට කිසිත් නැත. අඳුර උපදවන වෙනත් බලවේගයක් ද නැත. එම නිසා මුළු මහත් විශ්වය තුළැ මැ පවතින්නේ අඳුර බව තහවුරු වී තිබේ.

බොහෝ කලකට පෙරැ පැවැති අති මහත් වූ හිරු - එහි ඇති අධික උණුසුම නිසා දෝ - පිපිරී ගොස් කැබැලි විසිරී ගිය බවත්, විසිරී ගිය කැබැලි කල්යාමේ දී උණුසුම අඩු වී ගොස් ග්‍රහ වස්තු බවට පත් වී ඇති බවත් විද්‍යාවේ පිළිගැනීමයි. ඒ අනුවැ මුලින් පැවැති අති මහත් වූ හිරු, තරමක් කුඩා වුවත් උණුසුම අඩු වී ගොස් නැත. තවමත් පවතින උණුසුම මුළු මහත් විශ්වය පුරා පැතිරෙන්නේ ආලෝකය ලෙසිනි. හිරු රැස් අලෝකමත් සේ මැ උණුසුම් ද වන බව අප ගේ අවබෝධය යි.

අලෝකය නම් වූ හිරු ගේ ක්‍රියාකාරිත්වය නිසා අඳුර නමැති සවාභාවික ගුණය යටපත් වී යයි. අඳුර ඉවත් වී යාමක් නැත. එළිය එන විටැ අඳුර යටපත් වී, එළිය ඉවත් වන විටැ අඳුර යළි ප්‍රකෘතිමත් වීම මෙම යුගලයෙහි සැබෑ තත්වය යි. හිරු වටා යන මහ පොළව හිරු දෙසට හැරී අති අඩ රවුම ආලෝකමත් වෙද්දී, එයට පිටුපා ඇති පැත්ත ස්වාභාවික අඳුරේ පැවැතීම දිනපතා වන සිදුවීමකි. මෙහිදී යළිත් සිහිපත් කළ යුත්තේ අඳුර කොහි හෝ නොයන බවත්, එය එළිය පැමිණෙනු සමඟ නැති වී ගොස්, යළිත් එළිය ඉවත යන විට ඇති වෙන බව යැ. මේ බව වටහා ගත් මිනිසා හිරුගෙන් එළිය නො ලැබෙන විටැ කෘතීම වැ එළිය ලබා ගැනීම සඳහා විදුලි ආලෝකය නිපදවා ගත්හ. එතැන් පටන් මිනිසා ආලෝකය සඳහා හිරු මතැ මැ යැපී සිටින්නේ නැත.

අපගේ අනෙක් ස්වාභාවික යුගලය වනුයේ මුසාව සහ සැබෑව යි. එහිදී ස්වාභාවික පැත්ත වනුයේ සැබෑව යි. සැබෑව ගැන ගැඹුරින් සිතා බලන විටැ එහි ඇති ප්‍රකෘතිමත් බව පැහැදිලි වෙයි. එය විකෘති කළ විටැ මුසාව මතු වෙයි. මුසාවෙන් තොර වූ විටැ ඇත්තේ සැබෑවයි.

සත්වයෙකු (මිනිස් හෝ තිරිසන්) මෙ ලොවට බිහි වන විටැ මැ සිතෙහි උපදින්නේ ආදරය (සෙනෙහස) බව පෙනෙයි. ඒ බව සනාත වනුයේ අළුතින් උපදින සෑම සත්වයෙක් මැ තම මව කෙරෙහි දක්වන ආකල්පය නිසා යැ. මවට තුරුල් නොවන දරුවෙකු මෙතෙක් ලොවෙහි ඉපදී නැත. එහෙත් දෙවනු වැ මුහුණ දීමට සිදු වෙන කුස ගින්න, සීතල, උණුසුම වැනි බාහිර බලපෑම් නිසා ආදරය පැවැති තැනට අනාදරය ගලා ඒම නිරායාසයෙන් සිදු වනු පෙනේ.

අළුතින් උපදින සත්වයාට, ඔහුට හිමි හැම දෙය මැ බාධාවෙකින් තොර වැ ලැබුණේ නම්, මුසාවෙන් පිහිට පැතීමේ ඇවැසියාවක් නැති බව පෙනේ. සැබෑව හා ඇලී-බැඳී සිටීමෙන් තම අවැසියාවන් නො පිරිමැසෙන සෑම තැනෙකැ දී මැ මුසාවෙන් එය ඉටු කරැ ගැනීම ලොවෙහි මුල සිටැ මැ වූ සිදුවීමෙකි. සමාජයට පිය ඔසවන දරුවා දෙ මා-පියන්ගෙන් වැඩි සැලැකිලි ලබන්නට මුසාව යොදා ගත්තේ කවුරුන් හෝ එය ඉගැන්වූ නිසා නොවේ. පවුලේ වැඩිමල් සොහොයුරන්ගේ ගතිපැවැතුම් තුළින් මුසාවාදී ක්‍රියාවනට ඇබ්බැහි වන දරුවන්, හැදී-වැඩී මහ මිනිසුන් වෙද්දී මුසාවෙන් මැ ජය ගන්නට පෙළැඹීම සිරිතක් වී තිබේ.

මගේ ලිපියේ දෙ වැනි යුගලය වන සැබෑව සහ මුසාව අතුරින් මුසාව සමාජයට බොහෝ අහිතකර අයුරින් බලපාන බව සමාජය විසින් මැ පිළගෙනැ තිබේ. එමනිසා ආගමික ප්‍රතිපදා අතරත්, සමාජ නීති-රීති අතරත් මුසාව හානිකර ක්‍රියාවක් ලෙස ප්‍රකාශ වී තිබේ. එමෙන් මැ නීතිය ඉදිරියෙහි දී මුසාව නීතිවිරෝධී වී ඇති හෙයින් උසාවියකදී ප්‍රකාශයක් කරන විටැ එය නිබොරු යැයි දිව්රා සහතික කළ යුතු වැ තිබේ.

මෙම කරුණු ගැන ඉතා සමාජශීලී ලෙස සලකා බලා අපගේ ජීවිතයේ කිසි මැ අවස්ථාවෙකැ මුසාව එළි බැසීමට ඉඩ නොතබා පංච සීලය පිවිතුරු වැ රකින්නට අපි දිරි දරමු.



**සිරිවිමල මුතුකුමාරණ**
ඩැන්ඩිනොං

## පාළි පාඨ හෙළ බසින් - 47

''යථා'පි රුචිරං පුප්ඵං
වණ්ණවන්තං සගන්ධකං
ඒවං සුභාසිතා වාචා
සඵලා හෝති පකුබ්බතෝ''

*(ධම්මපද 52 - පුප්ඵ වග්ග)*

කැමැති මල්වල පවා
පැහැති මෙන් සුවඳැති සේ
දෙසූ දහමෙහි එලෙසැ මැ
පල ඇත පල ලබතහොත්

*සිරිවිමල මුතුකුමාරණ*
ඩැන්ඩිනොං

ඔබගේ සියලුම ජෝතිෂ්‍ය කටයුතු සඳහා
ජන්ම පත්‍ර බැලීමට
නම් තැබීමට
සුභ නැකත් සෑදීමට
පොරොන්දම් බැලීමට
වැඩි විස්තර සඳහා අමතන්න
0419 874 469
or Email your details to
astrology@pahana.com.au

For all your Advertising needs
mihirie@pahana.com.au
Mihirie Dissanayake
0414 546 833